**වැලිගම ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 17 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 24 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අතහැර දැමූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,527,930 ක ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා වර්ෂයේ ණයගැති හා ණයහිමි ශේෂ සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ආ) සභාවට අයත් රු.29,393,597 ක් වූ ඉඩම් 22 ක හා වටිනාකම තක්සේරු නොකරන ලද ඉඩම් 12 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතුව තිබුණු රු.2,542,200 ක දායක මුදල් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ''බැංකු ශේෂ'' සහ ''අයිරා ශේෂ'' එකිනෙක හිලව් කර ලැබෙන ශුද්ධ ශේෂය දැක්වීම නිසා රු.18,895 ක් වූ බැංකු අයිරා ශේෂය ගිණුම්වලින් අනාවරණය නොකෙරුණි.

## 1.3.2 අවිනිශ්චිත ගිණුම

රු.65,791 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය පිළිබඳව සොයා බලා අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකර සමුච්චිත අරමුදල් ගිණුමට ලියා හැර තිබුණි.

## 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.129,541,780 ක් වූ අතර, ඊට වර්ෂ 03 ක කාලයක් ඉක්මවන ලද රු.20,341,640 ක ශේෂ ඇතුළත් වී තිබුණි. මෙම ශේෂයට ඇතුළත් රු.2,422,380 ක ප්‍රාග්ධන ණයගැති ශේෂ පිළිබඳ කිසිදු විස්තරයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.35,292,980 ක් වූ අතර, ඊට වර්ෂ 03 ක කාලයක් ඉක්මවන ලද එකතුව රු.4,512,187 ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි. 2012 හා ඊට පෙර සිට ඉදිරියට එන රු.2,921,307 ක් වූ ශේෂ පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.42,311,371 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයද, එකතුව රු.83,974,765 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛනද, රු.2,422,380 ක් වූ කර්මාන්ත ණයගැති හා රු.3,413,433 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් උපලේඛන හා ශේෂ තහවුරු කිරීම්ද, රු.2,878,575 ක් වූ එක්වන් මුදල් ලැබීම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනද, යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 185 | සභාවේ ජංගම බැංකු ගිණුම්වල අතිරික්තව ඇති මුදල් ආයෝජනය කර සභාවට ආදායම් උපයා ගැනීමට සභාවේ ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |

(ii) රීති 193

අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වියදම් විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,513,647 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,945,594 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.568,053 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 65 ක් වූ මුළු පුනරාවර්තන වියදම් පැවතීමෙන් සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉහළ මට්ටමක පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම්, ස්වයං උත්පාදන ආදායම් සහ ආදායම් ආධාර මෙන්ම මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 90,263,707 | 34,224,388 | 56,039,319 | 58,750,060 | (2,710,741) |
| 2014 | 80,850,831 | 18,800,673 | 62,050,158 | 49,905,237 | 12,144,921 |
| 2013 | 61,832,190 | 12,950,896 | 48,881,294 | 41,780,717 | 7,100,577 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ දෙකේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර වල වර්ධනයක් පෙන්නුම් කළද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ස්වයං උත්පාදන ආදායමේ රු.6,010,839 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වර්ධනය වී ඇති අතර, එම තත්ත්වය කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණි.

(iv) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

(v) ඉහත අංක (i) සිට (iv) දක්වා ඡේදවල දැක්වෙන කරුණු අනුව සභාවේ ස්වයං උත්පාදන ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, පුනරාවර්තන වියදම් අවම කර ගැනීමටද කටයුතු කළ යුතුව ඇති බවත් විගණනයේ අදහසයි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාතය සාමාන්‍ය තත්ත්වයක පැවතියද, ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු. 20,341,640 ක ශේෂ ඇතුළත් වී තිබීමෙන් එම අනුපාත වල දැක්වෙන ආකාරයට ද්‍රවශීලතා තත්ත්වයක් නොපැවතින.

## 2.4 ආදායම් පරිපාලනය

----------------------

### 2.4.1 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ ශේෂය හා වර්ෂයේ බිල්කිරීම් සමඟ අයවිය යුතු මුළු වරිපනම් බදු මුදල රු.1,239,853 ක් විය. හිඟ ශේෂයෙන් සියයට 22 ක් හා බිල්කිරීම් වලින් සියයට 33 ක් පමණක් අයකර තිබුණු නමුත්, හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

### 2.4.2 අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ ශේෂය හා වාර්ෂික බිල්කිරීම් සමඟ අයවිය යුතු මුළු අක්කර බදු මුදල රු.122,643 ක් විය. හිඟ ශේෂයෙන් සියයට 0.11 ක් හා බිල්කිරීම් වලින් සියයට 4 ක් තරම් ඉතාම පහළ මට්ටමක අයකිරීම් පැවතියද හිඟ අක්කර බදු අයකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

## 2.4.3 බදුකුලී

-----------

වර්ෂය ආරම්භයට වූ හිඟ ශේෂය සහ වර්ෂයේ බිල්කිරීම් සමඟ අයවිය යුතු මුදල රු.3,362,537 ක් විය. හිඟ ශේෂයෙන් සියයට 36 ක් හා බිල්කිරීම් වලින් සියයට 79 ක් අයකර තිබුණු නමුත්, හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) (ආ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ මුද්දර ගාස්තු වලින් රු.16,176,883 ක් හා හිඟ උසාවි දඩ මුදල් වලින් රු.783,958 ක මුදලක් වර්ෂය අවසානය වන විටත් ලැබී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් වෙනුවෙන් කිසිදු මුදලක් ලැබී නොතිබුණි.

## 2.4.5 වෙනත් ආදායම්

--------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සහ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ව්‍යාපාර වලින් ඉකුත් වසරේ ආදායමෙන් සියයට එකක බද්දක් අයකර නොගෙන, ඊට අනුකූල නොවී ඉහත සඳහන් බදු අයකළ යුතු හෝටල් 06 කින් වසරකට රු.3,000 ක් බැගින් වන පරිදි බදු අයකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 කාර්ය සාධන ඇගයීම

----------------------

වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත වූ වැඩ යෝජනා 19 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමත වීථි පහන් සංඛ්‍යාව ඉක්මවා පහන් 860 ක් සවිකිරීම නිසා ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් කළ මුදලින් රු.219,814 ක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු නොකළ වසර 05 ක කාලයක් ඉක්මවූ තැන්පතු වල වටිනාකම රු.1,988,666 ක් විය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොක්මාදුව සුදර්ශනාරාම විහාරය අසල රණවිරු ගමගේ මාවත ඉදිකිරීම

2014 වර්ෂයේ ග්‍රාමීය පාලම් / ප්‍රවේශ මාර්ග වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මෙම කර්මාන්තයට රු.352,972 ක් 2015 අප්‍රේල් 10 දින ගෙවීම් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් කර්මාන්තය අතහැර දමා තිබුණි. සභාවට සිදුවූ පාඩුව අයකර ගැනීමට හා කොන්ත්‍රාත්කරු වැඩ පැහැර හැරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් 2016 මාර්තු 31 දින වන විටත් ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා භූමිය තුළ වොලිබෝල් ක්‍රීඩාංගනයක් ඉදිකිරීම

ජාතික තරුණ සේවා සභාවේ ප්‍රතිපාදන යටතේ දිවා සහ රාත්‍රී කාලයේ ක්‍රීඩා කල හැකි වොලිබෝල් ක්‍රීඩාංගනයක් සභා භූමිය තුළ ඉදිකිරීම සඳහා රු.1,049,814 ක වියදම් දැරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

## 3.4 බලය නොලත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභා අරමුදල් යෙදවිය නොහැකි කාරණයක් වූ අඩු ආදායම් ලාභීන්ට නිවාස ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් සභා අරමුදලින් රු.2,000,000 ක් වැයකර තිබුණි.

# 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.82,040,406 ක් වූ ඉතිරි කිරීම්ද, එක් වියදම් විෂයයක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.14,156,288 ක වියදම්ද, ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම රු.46,311,691 ක්ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.435,792 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3** **විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4** **වත්කම් කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2014 අගෝස්තු මස 21 වන දින පැවැති මාසික සභා රැස්වීමේදී වෙන්දේසි කර විකිණීමට තීරණය කර තිබූ යන්ත්‍ර 02 ක් හා වාහන 03 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් වෙන්දේසි කිරීමට කටයුතු නොකර සභා භූමිය තුළ දිරාපත් වෙමින් පැවතුනි.

(ආ) වත්කම් සමීක්ෂණය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 අනුව 2007 වසරේදී කරන ලද ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයේදී ලබාදුන් නිර්දේශ 2015 වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා සභාව සතු කනත්තගොඩ සුසාන භූමිය ස්වර්ණ භූමි, ජයභූමි හා රන්බිම යන වැඩසටහන් යටතේ කැබලි කර ප්‍රකාශන ඔප්පු ලබාදී තිබුණු නමුත්, ඒ පිළිබඳව සභාව දැනුවත් කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය